**මීගමුව අධ්‍යාපන කලාපය**

**දෙවන වාර ඇගයීම - 2025**

# සිංහල භාෂාව හා සාහිත්‍යය

**නම/විභාග අංකය:** .................................................

| 11 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 02 |
| --- | --- | --- |

සැලකිය යුතුයි

- **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80කි.**

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්,

(අ) කණ්ඨ ඕෂ්ඨජ අක්ෂරයක් ලියන්න.
(ආ) කණ්ඨ තාලුජ අක්ෂරයක් ලියන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

"විෂ්වකෝෂයක තොරතුරු සංග්‍රහ කෙරෙනුයේ මාතෘකා පාටවල අකාරාදී පිළිවෙළ අනුවය"

(iii) පහත සඳහන් පද විසන්ධි කරන්න.

(අ) ඔවුනොවුන් (ආ) සිතියම්

(iv) පහත සඳහන් ප්‍රකාශයේ ඇතුළත් තද්ධිත හා කෘදන්ත පද උපුටා දක්වන්න.

"ශිලාමය ප්‍රතිමා නිර්මාණය කිරීමේ ප්‍රතිභාව දක්වන්නෝ දුර්ලභ වෙති."

(අ) ..................................... (ආ) .....................................

(v) ධීවර භාෂාවේ යෙදෙන පහත සඳහන් වචනවලට අදාළ වන පොදු වහර ලියන්න.

(අ) හැන්නදිරාල (ආ) ජම්පර කළුව

(vi) පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවලට අදාළ වන අර්ථයන් ලියන්න.

(අ) "කැලේට පායපු හඳ වගේ "

(ආ) දීකිරට බළල්ලුත් සාක්කිලු"

(vii) පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදයන්හි විභක්ති ලියන්න.

(අ) <u>ගස්වල</u> සියොත්හු නද දෙති.

(ආ) පොලිස්පතිතුමා උසස් <u>නිලධාරීන්ට</u> උපදෙස් දෙයි.

(viii) මෙහි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) ඕ තොමෝ ආදරයෙන් මවුපියන් රැක බලා ගත්තේ ය.
(ආ) සිසුන් තිදෙනෙක් විශිෂ්ට සම්මාන හිමි කර ගත්හ.

(ix) ඉරි ඇඳි පදවලට අදාළ ව්‍යාකරණ විධි නම් කරන්න.

(අ) තුවාලකරු **<u>කෙමෙන්</u>** සුව අතට පත්විය.
(ආ) **<u>අවනීතියට</u>** ඉඩ නොතබන්න.

(x) පහත සඳහන් වාක්‍ය කර්මකාරයට හරවා ලියන්න.

(අ) විදේශිකයෝ වන සතුන් නැරඹූහ.
(ආ) නිවේදිකාව හඬ පාලනය කළාය .

(ලකුණු 2 x 10 = 20 යි)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ). "මුහුණු පොත" හෙවත් "ෆේස්බුක්" සමාජ වෙබ් අඩවි ජාලය තුළ ජනප්‍රිය අංගයක් බවට පත් වී ඇත. එය හොඳ තරමට ම ඇතැම් විට නරක ය. බොහෝ දෙනා එය හුදු විනෝදය සඳහා පමණක් භාවිත කිරීමට යාමෙන් මහත් ව්‍යසනයක් සිදුකර ගන්නා අවස්ථා අසන්න ට දකින්න ට ලැබේ. එබැවින් එය අවභාවිතය ට යාමෙන් වැළකී සමාජ සංවර්ධනය සඳහා යොදා ගැනීම කෙරෙහි කාගෙත් අවධානය යොමුවිය යුතුය.

(ආ). දේශීය සංස්කෘතිය හා බැඳුණු නිවැරදි ආහාර රටාවක ට අනාදිමත් කාලයක සිට උරුමකම් කියූ අපි පහසුව හා කාලය ඉතිරි කර ගැනීමේ අවශ්‍යතාව නිසා මෙරට මෙන් ම පිටරට ද නිෂ්පාදිත කෘත්‍රිම ආහාරවල ට ඇබ්බැහි වෙමින් සිටිමු. මෙමගින් ක්ෂණික ව මෙන්ම දීර්ඝ කාලීනව ද අතුරු ප්‍රතිවිපාක විඳීමට ඉඩ ඇති බවට පළකෙරෙන මත ගැන ද නිතර අසන්න ට ලැබේ. මෙබඳු කෘත්‍රිම ආහාරපාන පරිභෝජනයේ යෝග්‍යතාව විමසීම ට ලක්විය යුතුය.

(ඉ). සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල් විදේශ විනිමය උපයා ගැනීමට සංචාරක ව්‍යාපාරය අවියක් කොට ගනියි. ශ්‍රී ලංකාවේ පරිසරය හා ඓතිහාසික ස්ථාන නිසා සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට හැකි වී තිබේ. එනමුත් ඊට බාධා ද ඇතිවේ. සංචාරකයින් විදේශ විනිමය සමඟ මෙරටට අහිතකර දේද රැගෙන එයි. අප සංස්කෘතිය ට ගැළපෙන ලෙසත්, රටට හිතකර ලෙසත් මෙම සංචාරක ව්‍යාපෘතිය යොදා ගැනීම සඳහා වර්තමානයේ වඩාත් අවධානය යොමු විය යුත්තකි.

(ඊ). ලෝක පරිසර සංවිධානවල දැඩි අවධානයට ලක්වී ඇති ප්ලාස්ටික් අපද්‍රව්‍ය සම්බන්ධ ගැටලුව ශ්‍රී ලංකාවට ද ප්‍රබල තර්ජනයක් වී ඇත. අවිධිමත් ලෙස පරිසරය වෙත මුදා හැරෙන මේ අපද්‍රව්‍ය කඳු බොහෝ සෞඛ්‍ය හා පාරිසරික ගැටලුවලට මූලික වී ඇත. එම ගැටලුවලට පිළියම් ලෙස පරිසර නීති ක්‍රියාත්මක කිරීම ප්ලාස්ටික් දූෂණයේ අහිතකර බලපෑම් පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය පරිසර හිතකාමී ඇසුරුම් හඳුන්වා දීම ආදි බොහෝ දෑ යෝජනා වී ඇත. මේ පිළිබඳව පාසල් සිසුන්ගේ ද වැඩි අවධානය යොමු වීම ඉතා වැදගත් වෙයි.

(ලකුණු 25 යි)

3. පහත දැක්වෙන පාඨය වචන 60 - 70 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ලෝකයේ වාර්තා වන කොටි විශේෂ අතුරින් ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන කොටියා මෙරටට ආවේණික උප විශේෂයකි. සත්ත්ව විද්‍යාත්මක ව "පැන්තරා පාඩුස් කොටියා" ලෙස හඳුන්වන මෙම කොටි විශේෂයේ සාමාන්‍ය වර්ණය ගෙන දෙන වර්ණ දේහයක් ස්වාභාවිකව ම සිරුරේ නොමැති වීම හේතුවෙන් කළු පැහැති කොටි උපත ලබයි. ඒ අනුව කළු කොටියා යනු වෙනත් කොටි විශේෂයක් නොව මෙරටින් වාර්තා වන "පැන්තරා පාඩුස් කොටියා" යන උප විශේෂයේ ම වර්ණ ප්‍රභේදයකි. ඔවුන් ජීවත්වන පරිසරයේ අඳුරු ස්වභාවය හා අඩු උෂ්ණත්වය අනුව මෙලෙස වර්ණ ප්‍රභේදය ඇතිවී තිබෙන බව පර්යේෂකයන්ගේ මතයයි. කළු කොටි කිහිප දෙනෙකු ශ්‍රී ලංකාවේ වනාන්තර තුළින් වරින් වර වාර්තා වී ඇතත් 2009 වසරේ දී අවසන් වරට පිටදෙණිය, මාවුල්දෙණිය ප්‍රදේශයේදී මන්දකට අසුවීමෙන් කළු කොටියකු මිය යාමෙන් පසු එවැනි සත්ත්වයකු මෙරටින් වාර්තා වූයේ නැත. කෙසේ වෙතත් එම සත්ත්වයාගේ සම සංරක්ෂණය කර ගිරිතලේ වන ජීවී කෞතුකාගාරයේ කළු කොටි අනුරුවක් සකස් කෙරුණු අතර එය මෙරටින් වාර්තා වූ අවසන් කළු කොටියාගේ සාක්ෂිය ලෙස සැලකිණ. 2009 වසරේ කළු කොටියා මිය යාමට මත්තෙන් ද එම ප්‍රදේශයේ ම තවත් කළු කොටියෙකු මියගොස් තිබූ බවට සාක්ෂි ලැබී තිබුණි.

ශ්‍රී ලංකාවේ ජීවත්වන කොටි උප විශේෂ මෙරටට ආවේණික වන අතර වඳවීමේ තර්ජනය ට ලක්වූ සත්ත්ව විශේෂයක් වශයෙන් ලෝක සංරක්ෂණ සංගමය මඟින් රතු දත්ත ලේඛනයට ඇතුළත් කර ඇත. දැනට ශ්‍රී ලංකාවේ වාර්තා වන කොටියන් ප්‍රමාණය 700 - 950 ක් පමණ වන බව ගණනය කර ඇති අතර ඔවුන්ගෙන් 650 ක් පමණ රක්ෂිත ප්‍රදේශ තුළද 150 කට වැඩි සංඛ්‍යාවක් රක්ෂිත ප්‍රදේශවලින් බැහැරව ද ජීවත් වන බව ලෝක සංරක්ෂණ සංගමයේ බිළාලයන් පිළිබද විශේෂඥ කමිටුව සඳහන් කරයි. ඔවුන් වැඩි දුරටත් පෙන්වා දෙන්නේ මෙරට කොටීන්ට ඇති බරපතළම තර්ජනය සත්ත්ව කොටස් ලබා ගැනීම සඳහා දඩයම් කිරීම සහ කොටි මිනිස් ගැටුම බව යි. වාර්ෂික ව දිවයිනේ මධ්‍යම කඳුකරය ආශ්‍රිත ප්‍රදේශවලින් මේ ආකාරයේ කොටි මරණ සැලකිය යුතු ප්‍රමාණයක් වාර්තා වන අතර වාර්තා නොවන ප්‍රමාණය ඊට වඩා විශාල විය හැකි බව පර්යේෂකයන්ගේ අදහසයි. තේ වගාවට නතු වුණු මධ්‍යම කඳුකරයේ උස් භූමි ආශ්‍රිත ව සැරිසරන මෙම කොටියන් වතු කම්කරුවන්ට මහත් භීතිය උපදවන සත්ත්ව කොට්ඨාසයකි.

(ලකුණු 10 යි)

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ජනමාධ්‍ය හා ජනසන්නිවේදනය යනු ඉතා මෑතක සිට භාවිතයට ආ වදන් දෙකකි. සමාජය සමඟ අදහස් හුවමාරු කර ගැනීමේ ක්‍රමය යනු එහි කෙටි අරුතය. එහි සම්පූර්ණ අර්ථය නිරූපණය කිරීම අහසත් පොළොවත් යාව ඇත්තා සේ පෙනෙන ක්ෂිතිජය කරා ළඟා වීමට කොටියෙකු දරන උත්සහය ට නොදෙවෙනි නිෂ්ඵල ප්‍රයත්නයකි. ජනමාධ්‍යයෙන් බාහිර කිසිඳු දෙයක් ලෝකයෙහි නැත. ශිෂ්ටාචාරය, සාහිත්‍යය, කලාව, විද්‍යාව, අධ්‍යාපනය, පාලනය යනාදී සියල්ල ම මිනිස් සමාජයේ පැවැත්ම ට අවශ්‍ය කුදු මහත් හැම දෙයක් ම ජනමාධ්‍යයෙහි ගැබ්ව ඇත. විද්‍යාවෙහිත්, තාක්ෂණයෙහිත් අන්තය සොයා ගැනීමේ ප්‍රයත්නය ට යෙදී සිටින මිනිසා නිසා ම පෝෂණය වන ජනමාධ්‍යය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට වර්ග කළ හැකිවෙයි සංඥා, ශබ්ද ලිඛිත හෙවත් මුද්‍රිත වශයෙනි. ලෝකයේ මිනිසා පහළ වූයේ කවදා ද? ජනමාධ්‍යයද එදා සිටම ක්‍රම ක්‍රමයෙන් විකසිත වීමට පටන් ගත්තේ ය. වනචාරීව ගල් ගුහාවල හා රුප්පා මුල ජීවත් වීමට පටන් ගත් අතර එයට ම සම්බන්ධ කොට ගෙන ගිනි දල්වා අහස කරා විහිද යන දුම් වැටිවලින් යම් යම් අදහස් හුවමාරු කර ගැනීමෙහි සමත් විය. ඒ සමඟම මිනිසාගේ බුද්ධිය ද දියුණු වීමට පටන් ගත් විට ගල් ගුහාවල යම් යම් රූප කෙටීමෙන් ලිඛිත වශයෙන් තම අදහස් වෙන අයෙකුගේ දැන ගැනීම සඳහා මිනිසා විසින් මුලින් ම උපයෝගී කර ගත් ක්‍රමය "හූව" හෙවත් හූ ශබ්දය වෙයි. වනචාරී යුගයෙන් බැහැර ව ගිය මිනිසා අව් වැසිවලින් හා බාහිර කරදරවලින් ආරක්ෂා වීම සඳහා පැල්පත් හෝ දඬු නිවාස තනාගෙන ඒවායේ පදිංචිව සිටීමේ යුගයට එළඹීමෙන් පසුව තල්පතේ හා පැපයිරස් පත්‍රවල සටහන් තැබීම ලිඛිත ජනමාධ්‍යයේ මුල්ම අවදිය වෙයි.

(i) මිනිසා මුලින්ම අදහස් හුවමාරු කර ගැනීමට යොදා ගත් ක්‍රම දෙකක් නම් කරන්න.

(ii) ලිඛිත ජනමාධ්‍යයේ ආරම්භය සිදු වීමට මිනිසා කෙරෙහි බලපෑවේ කුමන සමාජ පසු බිමක්ද?

(iii) ජනමාධ්‍ය හා ජනසන්නිවේදනය යනු කුමක්ද?

(iv) 'ජනමාධ්‍යය' ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් දෙකක් ලියන්න.

(v) අර්ථ ලියන්න.

(අ) රුප්පා (ආ) නිෂ්ඵල

(ලකුණු 2 x 5 = 10 යි)

05. පානදුර හිරිමල්යාය ගම්මානයට ප්‍රවේශ වීම සඳහා ඉදි කර ඇති පාලම අබලන් තත්ත්වයෙන් පවතින බැවින් ඒ හරහා ගමන් කරන ගැමියන්ගේ මෙන්ම දරුවන්ගේ ද ජීවිත අනතුර දිනෙන් දින වැඩිවෙමින් පවතියි. පාසල් යන වයසේ දරුවන් ද විශාල ප්‍රමාණයක් ජීවත් වන මෙම ගමෙහි එහා මෙහා යෑමට ඇති එකම පාලම ද මෙයයි. එම නිසා නව පාලමක් ඉදි කිරීම සඳහා පානදුර මාර්ග සංවර්ධන අධිකාරියේ සංවර්ධන අධ්‍යක්ෂතුමා වෙත ලිපියක් ලියන්න. ඔබ සඳහන් කරන ගම්මානයේ යොවුන් සමිතියේ ලේකම් වික්‍රම ජයනාත් ඔබ යැයි සිතන්න.

<u>**නැතහොත්**</u>

- පහත සඳහන් විස්තරය පදනම් කරගෙන අත් පත්‍රිකාවක් සකස් කරන්න.

සුරත් ජයතිලක වන ඔබ මොනරාගල මහ වීදියේ අංක 05 දරන ස්ථානයේ "ජයදද" නමින් පොත්හලක් විවෘත්ත කිරීමට සැලසුම් කරමින් සිටියි. එය දිනපතා පෙ.ව. 7.00 සිට ප.ව. 5.00 තෙක් විවෘත්තව තිබෙන අතර ඉරිදා දිනවල සහ පෝය දිනයේ දී වසා තැබේ. විවිධ විෂයවලට අයත් පොත්පත් මෙන්ම පාසල් උපකරණ ද පහසු මිලට ගැනීමේ අවස්ථාව මෙමගින් උදා කෙරෙයි. ඔබ මිල දි ගන්නා පාසල් අභ්‍යාස පොත් සඳහා 10% ක වට්ටමක් ද ලබා දීමට අවස්ථාව සුදානම් කර ඇත.

(ලකුණු 15 යි)